# මහින්ද චින්තනය

මහින්ද රාජපක්ෂ මහතාගේ ජනාධිපතිවරණ ප්‍රකාශනය මහින්ද චින්තන නමින් නිකුත්කෙරී ඇත. විවිධ ක්ෂේත්‍ර අළලා ලියැවී ඇති ඒ ප්‍රකාශනය ශ්‍රී ල නි පක්ෂය නැවතත් තම අතීත උරුමය සොයායන ගමනක ආරම්භයක් වෙයි. ඒ ප්‍රකාශනය ඒ අයුරින් සකස් වී ඇත්තේ, චන්ද්‍රිකා කුමාරතුංග මහත්මිය පසුගිය දා වරකාපොළ පැවති රැස්වීමක දී කී පරිදි ශ්‍රී ල නි පක්ෂයේ බන්ඩාරනායකලාට, රාජපක්ෂලාට හෝ වෙනත් පක්ෂයකට අවශ්‍ය ආකාරයකට නොව, ජනතාවට අවශ්‍ය ආකාරයට ය. සැබවින් ම මහින්ද චින්තන ප්‍රකාශනයෙහි ඇත්තේ ජනතාවගේ, විශේෂයෙන් ම පනස්හයේ දරුවන්ගේ ප්‍රතිපත්ති ය. පනස්හයේ දරුවන් යන සංකල්පය අද ඊයේ ඇසූ අය ඒ නිර්වචනය කෙරී නැතැයි කියති. එබැවින් දෝ ඔවුහු එහි නිර්වචනය කුමක් දැයි අන් අයගෙන් අසති. ඒ ප්‍රශ්නයෙහි එක්තරා ආකාරයක ව්‍යාජ පණ්ඩිත බවක් ද ඇත. පනස්හයේ දරුවෝ යන්න නිර්වචනයකෙරී අදට අවුරුදු දහසයක්වන බව පමණක් මේ ව්‍යාජ පණ්ඩිතයන්ගේ දැනගැනීම සඳහා ලියා තැබිය යුතු ය.

මහින්ද චින්තන ප්‍රකාශනයට පනස්හයේ දරුවන්ගේ ප්‍රතිපත්ති ඉබේ ඇතුල්වූවා නො වෙයි. ඒ සඳහා පනස්හයේ දරුවන්ට විශාල අරගලයක් කිරීමට සිදුවිය. ඒ අරගලය ජයගැනීමට හැකිවූයේ මහින්ද රාජපක්ෂ මහතා ද පනස්හයේ දරුවකු වීම නිසා ය. තමන් ඇතුළු පනස්හයේ දරුවන්ගේ ප්‍රතිපත්ති වෙනුවෙන් රාජපක්ෂ මහතා ඉතා දැඩි ලෙස පෙනී සිටි බවට සැකයක් නැත. මහින්ද චින්තනවල වැදගත් අදහස් රාශියක් ගැබ් වී ඇත. ඉන් ප්‍රධාන ම කරුණු ලෙස මා දකින්නේ උතුරු හා නැගෙනහිර පළාත්, ජාතික ආර්ථිකයක් හා සංස්කෘතිය සම්බන්ධයෙන් ඇති ප්‍රතිපත්ති වෙයි. ජාතික ආර්ථිකයක් යන්න ඉතා ලිහිල් ව යොදන පද දෙකකි. ඉන් සාමාන්‍යයෙන් කියැවෙන්නේ ආර්ථිකය සම්බන්ධයෙන් රාජ්‍ය හා පෞද්ගලික අංශවල තුලනයකි. එහෙත් එහි එයට වඩා ගැඹුරු ප්‍රතිපත්ති තිබිය යුතු ය. කෙටියෙන් කියන්නේ නම් මෙරට ජාතික චින්තනය මත පදනම් වූ ආර්ථිකයක් හා එයට අදාළ ආර්ථික විද්‍යාවක් ගොඩනගා ගැනීමේ අවශ්‍යතාව වෙයි. ඒ කාරණයෙහි ලා පනස්හයේ දරුවන් අතර වූ ආර්ථික විද්‍යාව හදාරා ඇති අයගෙන් ප්‍රවාද නිර්මානයෙහි ලා දායකත්වයක් අපේක්ෂාකළ යුතු වෙයි.

ලංකාවේ රාජ්‍ය ව්‍යුහය ඒකීය විය යුතු බව මහින්ද චින්තන ප්‍රකාශයෙහි ඉතා පැහැදිලි ව කියැවෙයි. එහි කිසිම දෙගිඩියාවක් නැත. එමෙන්ම ඊනියා පශ්චාත් සුනාමි කළමනාකාර මණ්ඩල අහෝසි කෙරෙන බවට ද ඒ වෙනුවට ජය ලංකා නමින් ව්‍යාපෘතියක් ඇරඹෙන බව ද එහි සඳහන් වෙයි. මෙයින් ඒකීය රාජ්‍ය යන්න ශ්‍රී ල නි පක්ෂයේ පැරණි ප්‍රතිපත්තිය විය. එය ඒ පක්ෂයේ පැරණි ප්‍රතිපත්තිය වනුයේ අවුරුදු දෙදහසකට වැඩි කලක් තිස්සේ මෙරට එක්සේසත් රාජ්‍යයක් ව පැවත තිබීමත් එය අනිවාර්යයෙන් ම ශ්‍රී ල නි පක්ෂයේ උරුමය වීමත් නිසාත් ය. සිරිමාවෝ බණ්ඩාරනායක මැතිණියගේ ආණ්ඩුවකින් සම්පාදනයකරන ලද 1972 ප්‍රථම ජනරජ ව්‍යවස්ථාවෙන් ශ්‍රී ලංකාව ඒකීය රාජ්‍යයක් ලෙස ප්‍රකාශ කෙරිණි. 1992 පමණ දක්වා ම ශ්‍රී ල නි පක්ෂයෙහි ප්‍රතිපත්තිය වූයේ ඒකීය රාජ්‍යයක් යන්න ය. ඉන්පසු මහජන පක්ෂයේ ප්‍රතිපත්ති අත්තනෝමතික ව ජනතාවටත් පක්ෂයටත් හොරෙන් ශ්‍රී ල නි පක්ෂයේ ප්‍රතිපත්ති බවට පත්කිරීම හේතුවෙන් ඒකීය යන්න හැළී ගොස් ඒ වෙනුවට සන්ධීය යන්න ආදේශ විය. අද නැවත වරක් ශ්‍රී ල නි පක්ෂය තම උරුමය සොයා යමින් සිටින්නී ය. ඒ උරුමය සොයා යන ගමනේ නායකත්වයෙහි ඇත්තේ මහින්ද රාජපක්ෂ මහතා ය. කුමාරතුංග මහත්මිය රාජපක්ෂ මහතාට සම්පූර්ණයෙන් ම පක්ෂය භාර දී ඉවත්විය යුතු ය.

බටහිරයන්ගේ අනුග්‍රහය යටතේ ශ්‍රී ලංකා රාජ්‍යයට විරුද්ධව අවිගෙන සිටින ප්‍රභාකරන් නම් දෙමළ ත්‍රස්තවාදියා සමග සාකච්ඡාකිරීමට දෙයක් නැත. මෙරට ප්‍රශ්නය දෙමළ ජනතාවට සිදු වූ ඊනියා අසාධාරණයක් නොව සිංහලයාට හා සිංහල සංස්කෘතියට හිමිවිය යුතු තැන අහිමිකිරීම ය. 1505 සිට 1956 දක්වා සිංහලයාට අහිමි වූ දෑ හිමිකිරීමට පනස්හයේ ආණ්ඩුව පියවර ගැනීමේ දී එතෙක් මෙරට ජනවර්ගවලට බටහිර යටත්විජිතවාදීන් හිමිකර දී තිබූ යම් යම් වරප්‍රසාද නැති වීම පුදුමයට කරුණක් නො වෙයි. මේ වරප්‍රසාද නැතිවීම සමාජ අසාධාරණයක් ලෙස බටහිරයෝ ද දෙමළ ජාතිවාදීන් ඇතුළු ඔවුන්ගේ ගැත්තෝ ද අර්ථදැක්වූහ. දැනුම් ආධිපත්‍යය බටහිරයන් සතුව ඇතිවිට ඒ අර්ථකථනය ඊනියා ලෝක ප්‍රජාව පිළිගත් මතවාදය බවට පත්වෙයි. අපේ ඇතැම් කසිකබල් උගත්තු බටහිරයන්ගේ මතය දොහොත්මුදුන් දී පිළිගත්තෝ ය. කෙසේ වෙතත් මෙයින් කියැවෙන්නේ දෙමළ ජාතිවාදය 1956න් පසුව ඇතිවූවක්ය යන්න නො වෙයි. ඒ ලන්දේසි සමයේ සිට පැවතෙයි. සිංහලයන්ට අද නැගෙනහිර පළාත යැයි හැඳින්වෙන

© Prof. Nalin De Silva

ප්‍රදේශය අභිමිකිරීම සඳහා ලන්දේසීහු තමන් විසින් යාපනයේ දුම්කොළ වගාවට කෝරමණ්ඩල් වෙරළින් ආනයනය කරනු ලැබූ දෙමළ ජනවර්ගයට අයත්වුවකු ලවා යාල්පානම් වෛපව මාලෙ නමින් ව්‍යාජ ඉතිහාස පොතක් කවියෙන් නිර්මානය කරවූහ. ඉන්පසු බ්‍රිතානින් දෙමළ ජාතිවාදය පෝෂණය කළ අන්දම ප්‍රභාකරන් ඔහුගේ සීයලා බාප්පලා හා මස්සිනාලා කෘතියෙහි දක්වා ඇත. පනස්හයෙන් අවුරුදු හතළිහකට පෙර පොන්නම්බලම් අරුනාෂලම් මහතා ව්‍යවස්ථාදායක සභාවෙහි සිංහල මන්ත්‍රී සංඛ්‍යාවට වඩා දෙමළ මන්ත්‍රී සංඛ්‍යාවක් ඇතිවන ආකාරයට කටයුතු කළ බව පමණක් මෙහි දී සඳහන් කරමි.

කොටි සංවිධානය සමග සාකච්ඡා අවශ්‍ය නැත. කෙදිනක හෝ ඔවුන් අවිබලයෙන් යටපත්කිරීමට ලංකාණ්ඩුවට සිදුවනු ඇත. කෙසේ වෙතත් මහින්ද රාජපක්ෂ මහතා සාකච්ඡා සඳහා කොන්දේසි කිහිපයක් කොටි සංවිධානයට ඉදිරිපත්කරයි. ඒ අතර අවිහරණය ද වෙයි. ඒ යහපත් කොන්දේසියකි. බ්‍රිතානිය වැනි මහා ප්‍රජාතන්ත්‍රවාදීහු ද එවැනි කොන්දේසි ඉදිරිපත්කරති. රාජපක්ෂ මහතා තවදුරටත් කියා සිටින්නේ තමන් ඊනියා ස්වයංනිර්ණ අයිතිය හා නිජභූමිය වැනි සංකල්පවලට කොටු නොවන බව ය. නිජභූමිය යන්න පට්ටපල් කෙබරයක් මිස අනෙකක් නො වෙයි. ඝාතනය වීමට ටික කලකට පෙර නීලන් තිරුචෙල්වම් මහතාට පවා ඒ සංකල්පය හෙවත් බොරුව අත්හැරීමට සිදුවිය. ලංකාව පුරා ම විසිරී ඇති ජනවර්ගයක ස්වයංනිර්ණ අයිතිය යන්න විහිළුවක් පමණකි. සාකච්ඡා සම්බන්ධයෙන් රාජපක්ෂ මහතා  සමග  එකඟවිය නොහැකි වුවත් ඔහු නිවැරදි දිශාවට ගමනක් ආරම්භ කරඇති බව පැහැදිලි ය.

කලින් කී පරිදි මහින්ද චින්තන මුද්‍රණය වී ඇති ආකාරයෙන් නිකුත්කිරීමට විරුද්ධතා ශ්‍රී ල නි පක්ෂයේ උරුමයට පයින් ගැසූ පක්ෂ නායක නායිකාවන්ගෙන් හා ඊනියා උපදේශක මණ්ඩලවලින් ඇති විය. මේ උපදේශකයෝ බොහෝ විට බටහිර විශ්වවිද්‍යාලයකින් පශ්චාත් උපාධි ලත් අනුකාරකයෝ වූහ. සාමාන්‍ය බුද්ධි මට්ටමට අඩු බුද්ධිමට්ටම්වල වුවන්ට ද, අදාළ ක්ෂෙත්‍රයෙහි වචන හැසිරවීමේ ක්‍රමය දැන සිටින්නේ නම් ඇතැම් ක්ෂෙත්‍රවල පශ්චාත් උපාධියක් ලබාගැනීම විශ්වකර්ම වැඩක් නො වෙයි. මොවුන්ට කළ හැක්කේ තම ස්වාමිවරුන්ගේ මතවාද පුනරුච්චාරනයකිරීම පමණකි. මොවුහු මෙවර පනස්හයේ දරුවනට මතවාදී ක්ෂෙත්‍රයෙහි මෙන් ම දේශපාලනයෙහි දී ද පැරදුණ හ. අද ජාතික මතවාද මෙන් ම ජාතික දේශපාලනය ද තහවුරු වී ඇත.  ඒ බව පෙන්වන හොඳම උදාහරණය වන්නේ රනිල් වික්‍රමසිංහ මහතා ය. විජාතික බලවේගවල රූකඩයක් වූ ඔහුට ද අද ජාතික මතයක් මතුපිටින් හෝ ප්‍රකාශකිරීමට සිදු වන ඇත. තමන් නොදන්නා පස්යොදුන් රට, පැරකුම්බා, සංගායනා ආදිය ගැන කතාකිරීමට ඔහුට සිදු වී ඇත්තේ එබැවින් ය. එමෙන් ම ඔහුගේ මැතිවරණ ප්‍රකාශයේ ද එක් කොටසක උපශීර්ෂය ලෙස රට එකසේසත් කරමු යැයි සඳහන්කිරීමට ඔහුට සිදුවෙයි. ඔහු ඉන්පසු එක්සත් රටක් ගැන කතාකරනමුත් ඔහුට ජනතාවට අවශ්‍ය කිනම් දේශපාලනයක් ද යන්න ගැන හැඟීමක් ඇති බව ද ජනතාව සතුටුකරන දේ කීමට සිදු වී ඇති බව ද පැහැදිලි ය.

ජාතික මතවාද හා ජාතික දේශපාලනය පෙරට පැමිණ සිටිය ද, රාජපක්ෂ මහතාගේ ඇතැම් කසිකබල් උපදේශකයෝ ඒ ආපසු හැරවීමට මහන්සිගනිති. මහින්ද චින්තන නිකුත්කළදා එහි ප්‍රධාන දේශනය පැවැත්වීම සඳහා මේ උපදේශකයන් ආරාධනාකර ඇත්තේ විජාතික බලවේගවල නියෝජිතයකු වූ ද, වෛද්‍ය පීඨ  දෙකක හිටපු මහාචාර්යවරයකු වූ ද ඊනියා යථාර්ථවාදයකු වූ ද, කසිකබල් මාක්ස්වාදියකු වූ ද, බටහිර අර්ථයෙන් ගත්ත ද තවමත් දහනව වැනි සියවසේ අගභාගයේ ජීවත්වන්නකු වූ ද, පුද්ගලකයකුට ය. ඔහුට ගැලපෙන්නේ විජය කුමාරතුංග නම් සිංහල විරෝධියාගේ දේශපාලනය මිස රාජපක්ෂ මහතාගේ දේශපාලනය නො වෙයි. ඔහුට ආරාධනය කළ උපදේශකයන්ට අවශ්‍ය මහින්ද චින්තන නොව මාක්ස් කොවුර් චින්තන ය. කෙසේ වුවත් පනස්හයේ දරුවන්ගේ මැදිහත්වීම හේතුවෙන් ඒ පුද්ගලයාට දේශනය පැවැත්වීමට ඉඩ ලැබී නැත. උපදේශකයන්ට දිරවීමට නොහැකි වී ඇත්තේ මහින්ද චින්තන මිහිඳු චින්තනය මත පදනම් වී ඇති බැවිනි. මෙරට චින්තනයෙහි ප්‍රධාන ම සංරචකයක් වන්නේ අනුබුදු මිහිඳු හිමියන්ගෙන් අපට ලැබුණු මහින්ද චින්තනය ය. මහින්ද රාජපක්ෂ මහතාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයට මහින්ද චින්තන යන්න ඉතාම යෝග්‍යවන්නේ ඒ මහින්ද චින්තනය මත පදනම්වන බැවින් ය. මහින්ද චින්තන ඇරඹෙන්නේ මිහිඳු හිමියන් දේවානම් පියතිස්ස රජුට ඉඩකඩම්වල භාරකාරත්වය පිළිබඳ දුන් ඔවදනකින් ය. අද අවශ්‍යවන්නේ මහින්ද චින්තනය ප්‍රධාන ම සංරචකයක් වූ මෙරට ජාතික චින්තනය මත පදනම් වී විවිධ ක්ෂෙත්‍රවල අපේ දැනුම් නිර්මානයකිරීමත් ඒ උපයෝගී කරගනිමින් බටහිර යටත්විජිතවාදයෙන් මුළුමනින් ම නිදහස්වීමත් ය.

© Prof. Nalin De Silva